# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,476 - 2026 පෙබරවාරි මස 13 සිකුරාදා - 2026.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 44 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 46 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 20 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**මහර දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

උදිත ජයංග ලියනපතිරන,
අංක 145, පුෂ්පාරාම පාර, පහල බියන්විල, කඩවත.

*.................පැමිණිලිකරු.*

නඩු අංකය : 29/MB
ස්වභාවය : උකස් බැඳුම්කර
පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 4,900,000/-
මහර දිසා අධිකරණයේ
ඇස්කිසි අංක : 209/25

*එදිරිව*

01. වීරමුණ්ඩගේ ප්‍රභාත් රංජිත රාජපක්ෂ,
අංක 1261ඒ, සිරිල් රාජපක්ෂ මාවත, හුණුපිටිය, වත්තල.

02. ඥෙයි ෆර්සිනා රාජපක්ෂ හෙවත් ඥෙයි ෆර්සිනා ඩෙන්,
අංක 23/5/ඒ, සිහිනි සෙවන, ශාන්ත සෙබස්තියන් මාවත,
රාගම.

*..................විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩු වාර්තාවේ ඇතුළත්කර ඇති වර්ෂ 2024.11.11 දිනැති තීන්දු ප්‍රකාශය මගින් ඉහත 1 සහ 2 විත්තිකරුවන් වන වීරමුණ්ඩගේ ප්‍රභාත් රංජිත රාජපක්ෂ සහ ඥෙයි ෆර්සිනා රාජපක්ෂ *හෙවත්* ඥෙයි ෆර්සිනා ඩෙන් යන නුඹලා විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු මුදල එනම්, 2022.11.30 දක්වා වූ කාලසීමාවට අදාළව අංක 123 දරන ණය උගස්කරය යටතේ ලැබිය යුතු මුල් මුදල සහ පොළිය ද ඇතුළුව රුපියල් තිස්අට ලක්ෂ පනස් දහස (රු. 3,850,000/-) ක මුදලක් ද වර්ෂ 2022.12.01 දින සිට 2023.05.30 දින දක්වා එකී ණය උකස්කර ඔප්පුවේ සඳහන් මසකට සියයට හත (7%) බැගින් පොළිය වශයෙන් මාස 06කට අයවිය යුතු පොළී මුදල වශයෙන් රුපියල් දසලක්ෂ පනස්දහස (රු. 1,050,000/-) ක මුදලක් ද සමග නඩු පැවරූ දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා මසකට සියයට හත (7%) බැගින් පොළිය ද, තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කරන තෙක් නෛතික පොළිය ද ලබා ගැනීමට සහ නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහාත් 1 සහ 2 විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට නියෝග කොට ඇති බැවින් එම මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, එකී පහත විස්තරකර ඇති දේපළට අයත් සියලුම අයිතිවාසිකම්, පරවශාතා හා අනුබද්ධිතයන් විත්තිකරුවන්ගේ කවර ආකාරයකින් හෝ සියලු අයිතිවාසිකම්, හිමිකම්, බලපුළුවන්කාරකම්, හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙන් උපදන හා එකතුවන සියලු කුළී ලාභ හා අනෙකුත් ආදායම් ද සියලු ගිවිසුම් ද ඇතුලුව මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළට නිශ්චිතවම බැඳී ඇති බව සහ ඇස්කීසි කළ හැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් මහර දිසා අධිකරණයේ නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තරකර ඇති දේපළ,

**වර්ෂ 2026ක් වූ මාර්තු මස 16 දින පෙ. ව. 11.00 ට,**

ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී වෙන්දේසියේ ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුලු ගැණුම් මුදලෙන් 25% ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු (ෆවුන්ඩේජ් ගාස්තු) තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු හා පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75%ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත මහර දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

(දේපළට පිවිසුම් මාර්ගය.- කිරිබත්ගොඩ සිට හුණුපිටිය අලුත් පාරේ කිලෝමීටර් 2.7 ඉදිරියට ගොස් වමට ඇති දිප්පිගොඩ පාරේ මීටර් 500 ක් ඉදිරියට ගොස් දකුණු පැත්තේ ඇති අරෝසි ස්ටෝර්ස් ලඟින් ඇති පාරවල් දෙකෙන් අඩි 12ක් පළල ගුරු පාරේ මීටර් 30ක් යන විට එම පාර අවසානයේ පාරට මුහුණලා මෙම ඉඩම පිහිටා ඇත.)

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ හුණුපිටිය දකුණ ග්‍රාම නිලධාරී වසමේ හුණුපිටියේ පිහිටි "කැකුණගහවත්ත" යන ඉඩමට ජී. ධම්මික පී. ආරියතිලක බලයලත් මිනින්දෝරු තැන විසින් මැන බෙදා වෙන්කරන ලද අංක 35/2012 සහ 2012.07.03 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කරන ලද අංක 03 දරන බිම් කොටසට මායිම් : උතුරට : දූමින්ද ප්‍රනාන්දු සහ තවත් අයට අයත් ඉඩම සහ ලොට් 02 දරන බිම් කොටස ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් 02 සහ 04 දරන ඉඩම් කැබලි ද, දකුණට : සී. පීරිස් සහ තවත් අයට අයත් ඉඩම් ද, බස්නාහිරට : සී. පීරිස් සහ තවත් අයට අයත් ඉඩම් ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතරයි දශම තුනයි දෙක (පර්. 24.32) ක් විශාල ඉඩම ද, එහි පිහිටි ගසකොළ, පලතුරු ආදී සියලු දේ ද, එහි තිබෙන නිවස ද (මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දැනට මහර ජී 96/55 හි ලියාපදිංචි වී ඇත.)

ඉහත ඉඩම නැවත මැන සකස් කළ ඉඩම් කොටසක් වන,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ, හුණුපිටිය දකුණ ග්‍රාම නිලධාරී වසමේ හුණුපිටියේ පිහිටි "කැකුණගහවත්ත" යන ඉඩමට ආර්. ආර්. පී. එම්. සේනානි පෙරේරා බලයලත් මිනින්දෝරු තැන විසින් මැන බෙදා වෙන්කරන ලද අංක 34/2012 සහ 2013.07.03 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කරන ලද ලොට් සී දරන බිම් කොටසට මායිම් : උතුරට : දූමින්ද ප්‍රනාන්දු සහ තවත් අයට අයත් ඉඩම සහ බී දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් බී සහ ඩී දරන ඉඩම් කැබලි ද, දකුණට : සී. පීරිස් සහ තවත් අයට අයත් ඉඩම් ද, බස්නාහිරට : සී. පීරිස් සහ තවත් අයට අයත් ඉඩම් ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිහතරයි දශම තුනයි දෙක (පර්. 24.32) ක් විශාල ඉඩම ද, එහි පිහිටි ගසකොළ, පලතුරු ආදී සියලු දේ ද, එහි තිබෙන නිවස ද (මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දැනට මහර ජී 96/55 හි ලියාපදිංචි වී ඇත.)

ඉහත කී ඉඩම් කොටසට යාම් ඊම් සහ රථවාහන ගමනාගමනය සඳහා පොදුවේ ප්‍රයෝජන ගත හැකි මාර්ග අයිතිවාසිකම සහ අනෙකුත් පරවශ්‍යතා සඳහා.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ, හුණුපිටිය දකුණ ග්‍රාම නිලධාරී වසමේ හුණුපිටියේ පිහිටි "කැකුණගහවත්ත" යන ඉඩමට ජී. ධම්මික පී. ආරියතිලක බලයලත් මිනින්දෝරු තැන විසින් මැන බෙදා වෙන්කරන ලද අංක 35/2012 සහ 2012.07.03 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කරන ලද අංක 04 දරන බිම් කොටසට මායිම් : උතුරට : ලොට් 02 සහ 05 දරන ඉඩම් කැබලි ද, නැගෙනහිරට : හුණුපිටිය පාර සහ සී. පීරිස් ට සහ තවත් අයට අයත් ඉඩම් ද, දකුණට : සී. පීරිස් සහ තවත් අයට අයත් ඉඩම් ද, බස්නාහිරට : ලොට් 3 ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම හතයි පහ (පර්. 13.75) ක් විශාල බිම් තීරය අඩි දොළහක් පළල පාරක් වශයෙන් පොදුවේ ප්‍රයෝජන ගතහැකි මාර්ග අයිතිවාසිකම ද යන මෙකී දේපළ ද වේ. (මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දැනට මහර සී 778/76 හි ලියාපදිංචි වී ඇත.)

ඉහත කී ඉඩම් කොටස නැවත මැන සකස් කළ ඉඩම් කොටසක වන,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ, හුණුපිටිය දකුණ ග්‍රාම නිලධාරී වසමේ හුණුපිටියේ පිහිටි "කැකුණගහවත්ත" යන ඉඩමට ආර්. ආර්. පී. එම්. සේනානි පෙරේරා බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 34/2012 සහ 2013.07.28 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කරන ලද ලොට් ඩී දරන බිම් කොටසට මායිම් : උතුරට : මෙම පිඹුරේ බී සහ ඒ දරන ඉඩම් කැබලි ද, නැගෙනහිරට :හුණුපිටිය පාර සහ සී. පීරිස්ට සහ තවත් අයට අයත් ඉඩම් ද, දකුණට : සී. පීරිස් සහ තවත් අයට අයත් ඉඩම් ද, බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් සී ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම හතයි පහ (පර්. 13.75) ක් විශාල බිම් තීරය අඩි දොළහක් පළල පාරක් වශයෙන් පොදුවේ ප්‍රයෝජන ගතහැකි මාර්ග අයිතිවාසිකම ද යන මෙකී දේපළ ද වේ. (මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දැනට මහර ජී 307/86 හි ලියාපදිංචි වී ඇත.)

පෙර ලියාපදිංචිය : ජී 96/55, ජී 307/86

එස්. ජේ. සී. සමන්තිකා,
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - මහර.

වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 16 දින දී ය.

02-154

# විවිධ දැන්වීම්

**පාර්ලිමේන්තුව**

ඉන්ටර්නැෂනල් හියුමන් වොච් ෆවුන්ඩේෂන් - ඉන්ටර්නැෂනල් ඕගනයිෂේසන් ඔෆ් ඉකොනොමික් ඩිවලප්මන්ට් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

රිෂාඩ් බදියුදීන් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ ඉන්ටර්නැෂනල් හියුමන් වොච් ෆවුන්ඩේෂන් - ඉන්ටර්නැෂනල් ඕගනයිෂේසන් ඔෆ් ඉකොනොමික් ඩිවලප්මන්ට් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංස්ථාගත කිරීමයි.

01. දුප්පත් සහ අවශ්‍යතා ඇති දරුවන්ගේ භාෂා අධ්‍යාපනයට සහාය වීම, සිවිල් නීතිය හා මානව හිමිකම් නිරීක්ෂණය සම්බන්ධයෙන් මාර්ගගත ඩිප්ලෝමා සහ සහතික පාඨමාලා ලබාදීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) සඳහා කාර්මික නිෂ්පාදනය, කෘෂිකර්මය, සත්ත්ව පාලනය, මත්ස්‍ය කර්මාන්තය, තාක්ෂණික කුසලතා හා ශිල්ප කර්මාන්ත, ව්‍යවසායකත්ව සහාය, දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා නිෂ්පාදන හෝ නිෂ්පාදනය කිරීම, අපනයන කේන්ද්‍රිත ක්‍රියාකාරකම්, මූලික යටිතල පහසුකම් (තෙල් පිරිපහදු ශාලා, මාර්ග, වාරිමාර්ග, ජලාපවහන, විදුලිබල, සන්නිවේදන), වෛද්‍ය හා ශල්‍ය සහාය අරමුදල් සඳහා සහාය සහ මූල්‍ය ආධාර ලබාදීම.

02. සාමය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය වීම, ජාතික, සම්ප්‍රදායික, ආචාර විධි සහ සාමාජික සමගිය ප්‍රවර්ධනය කිරීම.

03. ආගම්වල විශ්වාසයන්, සම්ප්‍රදායන්, ආචාර-විධි සහ ආවරණයන් පිළිබඳව අන්‍යෝන්‍ය ගෞරවය සහ සම්මානය ප්‍රවර්ධනය කිරීම.

යනාදිය වේ.

රිෂාඩ් බදියුදීන්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
වන්නි දිස්ත්‍රික්කය.

02-207

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.